දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය පේරාදෙණිය විශ්වවිද්‍යාලය
njhlh; njhiyf; fy;tpepiyak; - Nguhjidg; gy;fiyf;fofk;
CENTRE FOR DISTANCE & CONTINUING EDUCATION – UNIVERSITY OF PERADENIYA

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර - පැරණි නිර්දේශය) (දෙසැම්බර් 2018)

**ECG 1: ආර්ථික විද්‍යාව I**

**උපදෙස්:**

- අවම තරමින් එක කොටසකින් ප්‍රශ්න දෙකක්වත් තෝරාගෙන ප්‍රශ්න හතරකට (4) පිළිතුරු සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ අඩංගු මුලු ප්‍රශ්න සංඛ්‍යාව 08 කි.
- ප්‍රස්තාර කඩදාසි හා ගනක යන්ත්‍ර භාවිත කල හැකිය.
- කාලය : පැය තුනයි (03)

---

## I කොටස

1 මාසික ආදායම රු. 84.00 වන පාරිභෝගිකයෙකුට X හා Y යන භාණ්ඩ දෙක මිලදී ගැනීමට අවශ්‍ය වී තිබේ. X හා Y භාණ්ඩ සඳහා මුලු උපයෝගීතා ශ්‍රිත පහත පරිදි දී ඇත.

$$TU_x = 92X - 2X^2$$

$$TU_y = 40Y - 2Y^2$$

X භාණ්ඩයේ මිල රු. 20.00 හා Y භාණ්ඩයේ මිල රු. 4.00 ලෙස දී ඇති බව උපකල්පනය කරන්න.

i. X හා Y භාණ්ඩවල සමතුලිත මිලදීගැනීම ව්‍යුත්පන්න කරන්න. (ලකුණු 10)

ii. X, Y භාණ්ඩ සඳහා ආන්තික ආදේශන අනුපාතිකය ($MRS_{xy}$) ව්‍යුත්පන්න කරන්න. සමතුලිත මට්ටමට අදාළ $MRS_{xy}$ හි වටිනාකම ගණනය කරන්න. (ලකුණු 05)

iii. සම්තුලිත මට්ටමෙදී මුදලේ ආන්තික උපයෝගිතාව ($MU_m$) ගණනය කරන්න. (ලකුණු 05)

iv. අනෙකුත් සාධක ස්ථාවරව පැවතියදී මෙම පාරිභෝගිකයාගේ මාසික ආදායම රු. 188/= දක්වා ඉහළ ගිය බව සිතන්න. X හා Y භාණ්ඩවලින් මිලදී ගන්නා නව සමතුලිත මට්ටම කුමක්ද? (ලකුණු 05)

2 i. උපයෝගිතා ප්‍රවේශය හා උපේක්ෂා වක්‍ර ප්‍රවේශය අතර සම්බන්ධතාව පාරිභෝගික ඉල්ලුම් න්‍යායට ඇති සම්බන්ධය විස්තර කරන්න. (ලකුණු 12)

ii. මින් වඩා හොඳ ප්‍රවේශය කුමක්ද? එසේ වන්නේ ඇයි? (ලකුණු 07)

iii. ඉහත ප්‍රවේශ අතරින් එකක් භාවිතයෙන් ඉල්ලුම් වක්‍රයක් ව්‍යුත්පන්න කරන්නේ කෙසේද? (ලකුණු 06)

3 i. කෙටි කාලයේදී ආන්තික සහ සාමාන්‍ය නිෂ්පාදන වක්‍ර අතර සම්බන්ධතාව හා ආන්තික පිරිවැය හා සාමාන්‍ය පිරිවැය අතර සම්බන්ධතාව විස්තර කරන්න. (ලකුණු 06)

ii ප්‍රස්තාර සටහනක් ඇසුරින් ආයතනයක දිගුකාලීන සාමාන්‍ය මුලු පිරිවැය වක්‍රය (LATC) කෙටිකාලීන සාමාන්‍ය මුලු පිරිවැය වක්‍රය (SATC) සමඟ සම්බන්ධ වන ආකාරය විස්තර කරන්න. (ලකුණු 09)

iii “ඒකාධිකාරී තරඟය, පූර්ණ තරඟය හා ඒකාධිකාරය අතර අතරමැදි තත්වයකි” ප්‍රස්තාර සටහන් ඇසුරින් මෙම ප්‍රකාශණය විස්තර කරන්න. (ලකුණු 10)

4 i ආතනයක සමතුලිතය යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? පූර්ණ තරගය හා ඒකාධිකාරය යටතේ ආයතනවල කෙටිකාලීන හා දිගුකාලීන සමතුලිතය සඳහා අවශ්‍ය කොන්දේසි විස්තර කරන්න. (ලකුණු 13)

ii “ඒකාධිකාරය යටතේ සම්පත් අවභාවිතය (misallocation) හා ඒ මගින් සමාජ සුභසාධනය අහිමිවීමක් සිදු වේ” මෙම ප්‍රකාශනය විවේචනාත්මකව අගයන්න. (ලකුණු 12)

## II කොටස

5 i. පරිභෝජනයේ ඉහළයාමක් පහත සඳහන් දෑ මත ඇතිකළ හැකි බලපෑම කුමක්ද? :

a. ආයෝජන (ලකුණු 03)
b. උද්ධමනය (ලකුණු 03)
c. සේවා නියුක්තිය (ලකුණු 03)

ii. විවෘත ආර්ථිකයක් සම්බන්ධව පහත දී ඇති තොරතුරු සැලකිල්ලට ගන්න. (සියලු අගයයන් රු. මිලියන වලිනි)

$C = 300 + 0.8Y_d$ ; $I = 50$ ; $G = 50$; $T = 20$ ; $TR = 20$
$X = 100$ ; $M = 20 + 0.2Y$

Y= ජාතික ආදායම; $Y_d$= වැය කල හැකි ආදායම; C= පරිභෝජනය; T= බදු;
G= රජයේ වියදම්; TR= සංක්‍රාම වියදම්; I= පෞද්ගලික ආයෝජන;
X= අපනයන; M= ආනයන

a. ජාතික ආදායමේ සමතුලිත වටිනාකම සොයන්න. (ලකුණු 05)
b. ජාතික ආදායමේ සමතුලිත මට්ටමේදී පරිභෝජන වියදම් ගණනය කරන්න. (ලකුණු 06)
c. පෞද්ගලික ආයෝජන රු. මිලියන 10කින් ඉහළ ගියේයැයි සිතන්න. ජාතික ආදායමේ නව සමතුලිතය සොයන්න. (ලකුණු 05)

6 i රටක මුදල් සැපයුම විභාග කිරීමේදී ‘පළල් මුදල්’ සංකල්පයේ වැදගත්කම සාකච්ඡා කරන්න. (ලකුණු 07)

ii ‘මුදල් ගුණකය’ සංකල්පය සැලකිල්ලට ගනිමින් මුදල් සැපයුම මත පහත සඳහන් ඒවායෙහි බලපෑම විස්තර කරන්න.

a. මහ බැංකුවේ විවට වෙළෙඳපල කටයුතු ප්‍රතිපත්තිය
b. මහ බැංකුවේ බැංකු අනුපාත ප්‍රතිපත්තිය
c. මහ බැංකුවේ ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා ප්‍රතිපත්තිය

(එක් කොටසකට ලකුණු 06 බැගිනි)

7 i පිලිප්ස් වක්‍රයෙන් පෙන්නුම් කරන්නේ කුමක්ද? (ලකුණු 05)

ii සේවා වියුක්තියට හේතු සහ එහි ප්‍රතිඵල කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 10)

iii ව්‍යුහාත්මක හා ඝර්ෂක සේවා වියුක්තිය අතර වෙනස දක්වන්න. (ලකුණු 10)

8 පහත සඳහන් දෑ සඳහා කෙටි සටහන් ලියන්න.

i විවෘත ආර්ථිකයක විනිමය අනුපාතිකය තීරණයවීමට බලපාන සාධක

ii මුදලේ අගය අඩුවීම හා අවප්‍රමාණයවීම

iii මුදල් ප්‍රතිපත්තියේ ඉලක්ක

iv ද්‍රවශීලතා පරාශය

V උද්ධමනීය පරතරය

(එක් කොටසකට ලකුණු 05 බැගිනි )

************************

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය - පේරාදෙණිය විශ්වවිද්‍යාලය
**CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION – UNIVERSITY OF PERADENIYA**

**ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර - පැරණි නිර්දේශය )**
**(දෙසැම්බර් 2018)**

ආර්ථික විද්‍යාව II
ECG 2 සංසන්දනාත්මක ආර්ථික සංවර්ධනය

මෙම ප්‍රශ්න පත්‍රයේ අඩංගු මුලු ප්‍රශ්න සංඛ්‍යාව 08 කි.
ඕනෑම **ප්‍රශ්න 05**කට පිළිතුරු සපයන්න.
කාලය : පැය තුනයි (03)

---

1. (i) මධ්‍යකාලීන යුගයේ මහා බ්‍රිතාන්‍යයේ පැවති වැඩවසම්වාදයේ ප්‍රධාන ආර්ථික ලක්ෂණ මොනවාද? (ලකුණු 10 යි)
   (ii) වැඩවසම් ක්‍රමය අහෝසිවී යාමට දායකවූ සාධක සාකච්ඡා කරන්න. (ලකුණු 10 යි)

2. (i) මහා බ්‍රිතාන්‍යයේ කාර්මික විප්ලවයේ වැදගත්කම විස්තර කරන්න. (ලකුණු 10යි)
   (i) මහා බ්‍රිතාන්‍යයේ කාර්මික විප්ලවයේ දෙවන අදියරෙන් එහි පළමු අදියර ඔබ වෙන කොට දක්වන්නේ කෙසේද? (ලකුණු 10යි)

3. මහා බ්‍රිතාන්‍යය හෝ ජර්මනිය සැලකිල්ලට ගනිමින් කාර්මික සංවර්ධනයේදී කෘෂිකාර්මික පරිවර්තනයේ කාර්යභාරය විභාග කරන්න. (ලකුණු 20යි)

4. මහා බ්‍රිතාන්‍යට පසු කාර්මීකරණය වූ යුරෝපීය රටවල්වල ආර්ථික සංවර්ධන ක්‍රියාවලියේදී රජයේ මැදිහත්වීම ඔබ විස්තර කරන්නේ කෙසේද? (ලකුණු 20යි)

5. එක්කෝ ප්‍රංශයේ නැත්නම් මහා බ්‍රිතාන්‍යයේ නිර්මාණය වූ නවීන ප්‍රවාහන ක්‍රමයේ සමාජ හා ආර්ථික වැදගත්කම තක්සේරු කරන්න. (ලකුණු 20යි)

6. ජර්මනිය, ප්‍රංශය හෝ සෝවියට් රුසියාව සැලකිල්ලට ගනිමින් පසුව කාර්මීකරණය වූ රටවලට ඇති වාසි හා අවාසි තත්වයන් සාකච්ඡා කරන්න. (ලකුණු 20යි)

7. “සෝවියට් රුසියාවේ නව ආර්ථික ප්‍රතිපත්තිය මඟින් උත්සාහ කරනු ලැබුවේ යුධ කොමියුනිස්ට්වාදය මඟින් සිදුවූ වැරදි නිවැරදි කර ගැනීමයි”. (ලකුණු 20යි)
   යුධ කොමියුනිස්ට්වාදය මඟින් ඇති වූ ගැටලු සැලකිල්ලට ගනිමින් නව ආර්ථික ප්‍රතිපත්තිවල ප්‍රධාන අරමුණු විභාග කරන්න.

8. පහත සඳහන් ඕනෑම හතරකට කෙටි සටහන් ලියන්න

(i) සොල්වරීනය

(ii) යුධ කොමියුනිස්ට්වාදය

(iii) දෙවන කොටු කිරීමේ ව්‍යාපාරය

(iv) ධාන්‍ය නීති

(v) වානිජවාදය (ලකුණු 04 x 05 = 20)

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය- පේරාදෙණිය විශ්වවිද්‍යාලය

தொடர் தொலைக் கல்விநிலையம் - பேராதனைப் பல்கலைக்கழகம்

CENTRE FOR DISTANCE & CONTINUING EDUCATION – UNIVERSITY OF PERADENIYA


## ශාස්ත්‍රවේදි සාමාන්‍ය උපාධි පරීක්ෂණය (දෙසැම්බර් - 2018)

## ආර්ථික විද්‍යාව 111

## ECG 3 ව්‍යවහාර ආර්ථික විද්‍යාව

**ඕනෑම ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**
**මෙම ප්‍රශ්න පත්‍රයේ අඩංගු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 10කි.**
**සෑම ප්‍රශ්නයකටම දෙනු ලබන ලකුණු සංඛ්‍යාව එයට අදාළව දක්වා ඇත.**
**(කාලය පැය තුනයි)**

1. (i). සංවර්ධනය වෙමින් පවතින රටවල ප්‍රධාන ලක්ෂණ දක්වන්න. (ලකුණු 06)

   (ii). ආර්ථික වර්ධනයෙන් ආර්ථික සංවර්ධනය වෙන්කොට දක්වන්න. (ලකුණු 06)

   (iii). පසුගිය දශක පහ තුළ ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනට බලපෑ ප්‍රධාන සාධක කෙටියෙන් සඳහන් කරන්න. (ලකුණු 08)

2. (i). ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව සහ ආදායම් ව්‍යාප්ති පරතරය හඳුනා ගැනීමට භාවිතා කරන මිනුම් මොනවාද?. (ලකුණු 08)

   (ii). පසුගිය දශක දෙක තුළ ශ්‍රී ලංකාව විසින් අනුගමනය කරනලද දරිද්‍රතාව ඉවත් කිරීමේ ක්‍රමෝපායන් සාකච්ඡා කරන්න. (ලකුණු 12)

3. (i). 'ශ්‍රී ලංකාවේ ජනගහනයෙහි වයස් ව්‍යුහය කාලයත් සමග වෙනස් වේ' ඔබ මෙම ප්‍රකාශය සමග එකග වන්නේද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න. (ලකුණු 10)

   (ii). වයස්ගත ජනගහනයෙහි ආර්ථික බලපෑම් මොනවාද? අදහස් දක්වන්න. (ලකුණු 10)

4. (i). ශ්‍රී ලංකාවේ තරුණ ජනගහනය අතර ඉහළ සේවා වියුක්තියට හේතු සාකච්ඡා කරන්න. (ලකුණු 10)

   (ii). එය අඩු කිරීමට ශ්‍රී ලංකා රජය විසින් ගනු ලැබූ ප්‍රතිපත්ති මිනුම් පිළිබඳ අදහස් දක්වන්න. (ලකුණු 10)

5. (i). දේශීය කෘෂි කර්මාන්තය සහ අපනයන කෘෂිකර්මාන්තය අතර වෙනස්කම් මොනවාද?
(ලකුණු 05)

(ii). ශ්‍රී ලංකාවේ දේශීය කෘෂි අංශය මුහුණ දෙන ප්‍රධාන ගැටළු සාකච්ඡා කරන්න.
(ලකුණු 15)

6. (i). ආනයන ආදේශන ප්‍රතිපත්තිය සහ අපනයන ප්‍රවර්ධන ප්‍රතිපත්තිය අතර වෙනස්කම් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii). 1977න් පසු කාර්මික අංශය ප්‍රවර්ධනයට ශ්‍රී ලංකා රජය විසින් ගනු ලැබූ ප්‍රතිපත්ති මිනුම් මොනවාද? (ලකුණු 10)

7. (i). ශ්‍රී ලංකාවේ ආනයන සහ අපනයන අංශවල ව්‍යුහාත්මක වෙනස්කම් දක්වන්න.
(ලකුණු 10)

(ii). මෙම වෙනස්කම්වලට දායක වූ සාධක පිළිබඳ අදහස් දක්වන්න. (ලකුණු 10)

8. (i). ශ්‍රී ලංකාවේ වර්තමාන බදු ආදායම් ව්‍යුහය විස්තර කරන්න. (ලකුණු 05)

(ii). මෑත අතීතයේ ඉහත වෙනස්කම්වලට හේතු දක්වන්න. (ලකුණු 07)

(iii). අද ශ්‍රී ලංකාවේ ෆිස්කල් ප්‍රතිපත්තිය මුහුණපාන වැදගත් ප්‍රශ්න සාකච්ඡා කරන්න.
(ලකුණු 08)

9. (i). ශ්‍රී ලංකාවේ අපනයන කෘෂි අංශයේ වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න.
(ලකුණු 05)

(ii). අපනයන කෘෂික.ර්මය ප්‍රවර්ධනයට ශ්‍රී ලංකා රජය විසින් ගනු ලැබූ ප්‍රතිපත්ති මිනුම් මොනවාද? (ලකුණු 15)

10. ශ්‍රී ලංකාවට අදාළව පහත ඕනෑම **හතරක්** පිළිබඳ කෙටි සටහන් ලියන්න.
(එකකට ලකුණු 05 බැගින්)

(a). උපත් අනුපාතිකය තීරණය කරන සාධක
(b). ආනයනවල සංයුතීන්
(c). දේශීය කෘෂිකර්මාන්තයෙහි පෞද්ගලික ආයෝජන
(d). තීරු බදු ප්‍රතිසංස්කරණ
(e). වෙළෙඳ පරතරය
(f). වතු අංශයේ ඉඩම් ප්‍රතිසංස්කරණවල බලපෑම